# අ.පො.ස. සාමාන්‍ය පෙළ

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

# Business and Accounting Studies

සැකසුම හා ඉදිරිපත් කිරීම:-

## ධම්මික හෙට්ටිආරච්චි

රජයේ පිළිතුරු පත්‍ර පරීක්ෂක,

Teacher of st.peter's college

077 6530215

# ව්‍යාපාර පරිසරය

## අන්තර්ගතය

2.1 ව්‍යාපාර පරිසරය හා ව්‍යාපාර කටයුතු
- ⋆ ව්‍යාපාර පරිසර සාධක
- ⋆ රජයේ බලපෑම්
- ⋆ රජයේ නීති රීති

2.2 තාක්ෂණික හා ආර්ථික පරිසරය
- ⋆ තාක්ෂණික පරිසරයේ බලපෑම්
- ⋆ ආර්ථික පරිසර බලපෑම්

2.3 ගෝලීය පරිසරය හා ව්‍යාපාර කටයුතු
- ⋆ ගෝලීයකරණය
- ⋆ ගෝලීය පරිසරයේ බලපෑම්

2.4 ව්‍යාපාරයක පරිසරය අධ්‍යයනය කිරීමේ වැදගත්කම

# ව්‍යාපාර පරිසරය

❑ **ව්‍යාපාර පරිසරය යන්න අර්ථ දක්වන්න.**

➢ *ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී ඊට බලපෑම් ඇතිකරන විවිධ සාධක ක්‍රියාත්මක වන වටපිටාව ව්‍යාපාර පරිසරය ලෙස හැඳින්වේ.*

**ව්‍යාපාර බිහිවීමට, පැවැත්මට, වර්ධනයට හෝ බිඳවැටීමට ව්‍යාපාර පරිසරය සෘජුවම බලපායි. අවට පරිසරයේ සිදුවන වෙනස්කම් අවබෝධ කර ගනිමින් ව්‍යාපාරික අවස්ථා වැඩි වැඩියෙන් ජනිත කරගැනීමටත්, මුහුණදීමට සිදුවන විවිධ අවදානම් අවම කරගැනීමටත් ව්‍යාපාරිකයා සිය පරිසරය පිළිබඳව දැනුම යොදාගත යුතුය.**

❖ ව්‍යාපාර පරිසරය නියම ආකාරයෙන් අවබෝධ කර ගැනීම ව්‍යාපාරයකට ඉතා වැදගත් වේ. එසේ වැදගත්වීමට හේතු.




1. නව ව්‍යාපාරික අවස්ථා හඳුනා ගත හැකි වීම.
2. පරිසර වෙනස්වීම් වලට අවශ්‍ය පරිදි වෙනස් වීමට.
3. තරඟකාරීත්වයට සාර්ථක ලෙස මුහුණ දීම.
4. නවීන තාක්ෂණික වෙනස්කම් හඳුනාගත හැකිවීම.
5. ව්‍යාපාරික දුර්වලතා හඳුනාගත හැකි වීම හා ඒවා නිවැරැදි කරගත හැකිවීම.

# ව්‍යාපාර පරිසරය වර්ග කිරීම.

**ව්‍යාපාර පරිසරය ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන පරිදි වර්ග කළ හැකිය.**

- ✓ අභ්‍යන්තර පරිසරය.
- ✓ බාහිර පරිසරය.

**ව්‍යාපාර පරිසර සාධක ගැලීම් සටහනක් මගින් ඉදිරිපත් කිරීම.**

ව්‍යාපාර පරිසරය

අභ්‍යන්තර පරිසර සාධක.

- අයිතිකරුවෝ
- කළමනාකරුවෝ
- සේවකයෝ

බාහිර පරිසර සාධක

- ගනුදෙනුකරුවෝ
- සැපයුම්කරුවෝ
- තරඟකරුවෝ
- දේශපාලන පරිසරය
- තාක්ෂණික පරිසරය
- ආර්ථික පරිසරය
- ගෝලීය පරිසරය
- නෛතික පරිසරය

# අභ්‍යන්තර පරිසරය (Internal Environment)

**ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය හඳුන්වන්න.**

- ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වයට බලපාන ව්‍යාපාරය තුළ ක්‍රියාත්මක වන විවිධ පාර්ශව සහ ව්‍යාපාරය තුළ පවතින අනෙකුත් සාධක අභ්‍යන්තර පරිසරය ලෙස හැඳින්විය හැකිය.

**නැතහොත්,**
**ව්‍යාපාරකට පාලනය කළ හැකි, බලපෑම් කළ හැකි හා වෙනස් කළ හැකි සාධකවලින් සමන්විත පරිසරය අභ්‍යන්තර පරිසරය වේ.**



## ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක

- අයිතිකරුවෝ
- කළමනාකරුවෝ
- සේවකයෝ




## ව්‍යාපාරයක අභ්‍යන්තර පාර්ශවයන්ගෙන් ව්‍යාපාරයට වන බලපෑම.

- **අයිතිකරුවෝ**

**ව්‍යාපාරයට ප්‍රාග්ධනය සපයන පුද්ගලයන් හෝ ආයතන අයිතිකරුවන් වෙති.**

**★ අයිතිකරුවන්ගෙන් ව්‍යාපාරයට බලපෑම් විය හැකි සාධක**

- මූල්‍ය ශක්තිය.
- ව්‍යාපාරික දැනුම.
- පළපුරුද්ද.
- දැක්ම.

## ● කළමනාකරුවෝ

වයාපාරයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්පත් මෙහෙයවන්නේ කළමනාකරුවන්ය. ඔවුන් ව්‍යාපාරයේ තීරණ ක්‍රියාවට නංවයි.

★ කළමනාකරුවන්ගෙන් ව්‍යාපාරයට බලපෑම් විය හැකි සාධක.

- දැනුම.
- ආකල්ප.
- පළපුරුද්ද.
- ගනු ලබන තීරණ.

## ● සේවකයෝ

තම දක්ෂතාව හා හැකියාව ප්‍රයෝජනයට ගනිමින්, පවරන ලද කාර්ය නිසි ආකාරයෙන් ඉටුකරන පුද්ගලයෝ, සේවකයෝ වෙති.

★ සේවකයන්ගෙන් ව්‍යාපාරයට බලපෑම් විය හැකි සාධක.

- දක්ෂතා.
- පුහුණු නුපුහුණු බව.
- පළපුරුද්ද.
- ආකල්ප.
- කැපවීම.

# බාහිර පරිසරය (External Environment)

**ව්‍යාපාරයක බාහිර පරිසරය හඳුන්වන්න.**

ව්‍යාපාරය ක්‍රියාකාරීත්වයට බලපාන ව්‍යාපාරයෙන් පරිබාහිරව ක්‍රියාත්මක වන **පාර්ශව** සහ බලවේග බාහිර පරිසරය ලෙස හැඳින්වේ.

**නැතහොත්;**
**ව්‍යාපාර ආයතනයකට පාලනය කළ නොහැකි බලපෑම් කළ නොහැකි හා වෙනස් කළ නොහැකි සාධකවලින් සමන්විත පරිසරය වේ.**





# ව්‍යාපාරයක බාහිර පරිසර සාධක

- ගනුදෙනුකරුවෝ.
- සැපයුම්කරුවෝ.
- තරඟකරුවෝ.
- දේශපාලන පරිසරය.
- නෛතික පරිසරය.
- තාක්ෂණික පරිසරය.
- ආර්ථික පරිසරය.
- ගෝලීය පරිසරය.

**ගනුදෙනුකරුවෝ**

**ව්‍යාපාරයක භාණ්ඩ හා සේවා මිලදී ගන්නෝ ගණුදෙනුකරුවෝ වෙති.**

## ගනුදෙනුකරුවන්ගෙන් ව්‍යාපාරයට බලපෑම් විය හැකි සාධක.

- ගණුදෙනුකරුවන්ගෙන් මිලදීගැනීමේ රටාවන් වල සිදුවන වෙනස්කම්.

## තරගකරුවෝ

- යම්කිසි ව්‍යාපාරයක භාණ්ඩ හෝ සේවා වලට සමාන භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කරන ආයතන තරගකරුවන් ලෙස සැලකේ.

## තරඟකරුවන්ගෙන් ව්‍යාපාරයට බලපෑම් විය හැකි සාධක.

- ✓ තරඟකරුවන් තම ව්‍යාපාර කටයුතු මෙහෙයවන ආකාරය.
- ✓ තරගකරුවන්ගේ නිෂ්පාදිත වල මිල.
- ✓ තරගකරුවන්ගේ නිෂ්පාදිත වල ගුණාත්මක බව.
- ✓ තරඟකරුවන්ගේ අලෙවි උපක්‍රම.

## සැපයුම්කරුවෝ

- ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී අවශ්‍ය වන අමුද්‍රව්‍ය හා ප්‍රවාහන පහසුකම් ආදී වෙනත් සේවා සපයන පාර්ශව සැපයුම්කරුවන් ලෙස සැලකේ.

සැපයුම්කරුවන්ගෙන් ව්‍යාපාරයට බලපෑම් විය හැකි සාධක.

- සපයන අමුද්‍රව්‍ය හා අනෙකුත් සේවා අඛණ්ඩව කලට වේලාවට ලබා දීම.
- සපයන අමුද්‍රව්‍ය හෝ අනෙකුත් සේවා වල ගුණාත්මක බව.

## දේශපාලන පරිසරය

- යම් රටක රජය විසින් ආර්ථික කටයුතු මෙහෙයවීමේදී අනුගමනය කරන ප්‍රතිපත්ති, නීතිරීති, අන්තර්ජාතික දේශපාලන බලපෑම් යනාදී සාධක වලින් දේශපාලන පරිසරය සමන්විතවේ.

## ව්‍යාපාර කෙරෙහි රජය මැදිහත් වන ආකාරය.

- යටිතල පහසුකම් සැපයීම (විදුලිය, මාර්ග තැනීම, ජලය ලබාදීම)
- පාරිභෝගික ආරක්ෂාව සුරක්ෂිත කිරීම.
- ව්‍යාපාර ලියාපදිංචි කිරීම හා බලපත්‍ර ලබා දීම.
- සේවක සුරක්ෂිතතාව සඳහා කටයුතු කිරීම.
  - වැටුප් තීරණය කිරීම.
  - සේවා කාලය තීරණය කිරීම.
  - නිවාඩු තීරණය කිරීම.
  - බදු පැනවීම.
  - බදු සහන ලබා දීම.







## ව්‍යාපාර වලට බලපෑම් ඇතිවිය හැකි දේශපාලන පාරිසරික සාධක

- විවෘත **ආර්ථික** ප්‍රතිපත්ති.
- පෞද්ගලීකරණය.
- අන්තර් ජාතික වෙළඳ ගිවිසුම්.
- අන්තර්ජාතික සම්බන්ධතා.

## නෛතික පරිසරය

පාරිභෝගිකයා ආරක්ෂා කිරීම සඳහාත්, දේශීය නිෂ්පාදකයින් සහ ව්‍යාපාරික ප්‍රජාව ආරක්ෂා කිරීම් සඳහාත් පරිසරය ආරක්ෂා කිරිම සඳහාත් සම්මත අණපනත් හා නීතිරීති නෛතික පරිසරයට අයත් වේ.

## රජය විසින් පනවන ව්‍යාපාර නීති රීති වල ප්‍රධාන අරමුණු

- පාරිභෝගිකයා ආරක්ෂා කිරීම.
- ව්‍යාපාර ආරක්ෂා කිරීම.
- සමාජය ආරක්ෂා කිරීම.
- පරිසරය ආරක්ෂා කිරීම.

## ව්‍යාපාර වලට බලපෑම් ඇතිවිය හැකි නෛතික පරිසර සාධක

- නීතිරීති.
- අණපනත්.
- රෙගුලාසි.






## ව්‍යාපාර වලට බලපෑම් ඇති කරන අණපනත්

- 2007 අංක 07 දරණ සමාගම් පනත
- 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනත.
- 1954 අංක 14 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත.
- කිරුම් මිනුම් පනත.
- ආහාර පනත.

## ව්‍යාපාර වලට බලපෑම් ඇති කරන නීති රීති ක්‍රියාත්මක කිරීම සඳහා පනවා ඇති තනතුරු

- සමාගම් රෙජිස්ටාර්.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිවරයා.
- මහජන සෞඛ්‍ය පරීක්ෂක.
- පරිසර නිලධාරිවරයා.

## ව්‍යාපාර වලට බලපෑම් කිරීම සඳහා පනවා ඇති ආයතන.

- මධ්‍යම පරිසර අධිකාරිය.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය.
- කම්කරු විනිශ්චය සභාව.

## තාක්ෂණික පරිසරය

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී බලපෑම් ඇති වීමට තුඩු දෙන නව තාක්ෂණික උපකරණ, යන්ත්‍ර සූත්‍ර, නව ක්‍රමවේද, නව සොයාගැනීම් යන ආදිය ඇතුළත් පරිසරය තාක්ෂණික පරිසරය ලෙස හැඳින්වෙයි.

## ව්‍යාපාර කෙරෙහි බලපෑමක් ඇති කරන තාක්ෂණික පරිසර සාධක.

- සන්නිවේදන තාක්ෂණය.
- තොරතුරු තාක්ෂණය.
- ප්‍රවාහන තාක්ෂණය.
- නිෂ්පාදන තාක්ෂණය.
- පරිගණක තාක්ෂණය.
- ඩිජිටල් තාක්ෂණය.
- නැනෝ තාක්ෂණය.



# තාක්ෂණික පරිසරයේ බලපෑම්.

- හිතකර බලපෑම්

නිෂ්පාදිත වල ගුණත්වය ඉහළ යාම.

**ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ඉහල යාම.**

නාස්තිය අවම වීම.

සංකීර්ණ නිෂ්පාදන ක්‍රියාවලිය සරල වීම.

වැඩ පරිසරය වඩාත් සතුටුදායක වීම.

පාරිභෝගික අපේක්ෂාවන්ට හිතකර පරිදි භාණ්ඩ හා සේවා සැපයීමට හැකියාව ලැබීම.

වැඩි නිෂ්පාදනයක් කළ හැකි වීම.

වෙළඳාම වැඩිවීම.

කාලය ඉතිරි වීම.

උපරිම ලාභය කරා යාහැකි වීම.



## ➢ අහිතකර බලපෑම්

- සේවක පුහුණු කිරීමේදී ගැටලු පැන නැගීම.
- භාණ්ඩ ඉක්මනින් යල් පැනීම නිසා ඇතිවන අවාසි.
- ප්‍රාග්ධන ආයෝජනය සඳහා විශාල මුදලක් අවශ්‍ය වීම.
- යන්ත්‍ර සූත්‍ර සමඟ වැඩ කරන සේවකයින් යාන්ත්‍රික වීම.
- පරිසර දූෂණය අධිකව සිදුවීම.
- පෙර අත් නොවිදි දෝෂයන් අත්විදීමට සිදු වීම.



# ➢ තාක්ෂණික පරිසරයේ නව සොයාගැනීම්.

❖ පරිගණක තාක්ෂණය යටතේ,

- නවීන පරිගණක.



❖ ප්‍රවාහන තාක්ෂණය යටතේ,

- බහාලුම් (container)
- භාණ්ඩ ඔසවන යන්ත්‍ර
- නවීන පහසුකම් සහිත වාහන.







❖ ඩිජිටල් තාක්ෂණය යටතේ,

- කාලය මැනීමේ උපකරණ.
- බර මැනීමේ උපකරණ.
- සන්නිවේදන උපකරණ.








- සන්නිවේදන තාක්ෂණය යටතේ,
- විද්‍යුත් තැපැල (email)
- චන්ද්‍රිකාපණිවුඩ හුවමාරු ක්‍රමය.
- අන්තර්ජාලය.





- වෛද්‍ය තාක්ෂණය යටතේ,
- විවෘත හදවත් සැත්කම්.
- නල දරු උපත්.
- ප්‍රතිශක්තිකරණ එන්නත්.




- නිෂ්පාදන තාක්ෂණය යටතේ,
- ඩිජිටල් කිරුම් මිනුම් උපකරණ.
- රොබෝවරු.




නව තාක්ෂණික සොයා ගැනීම් නිසා යල්පැන ඇති නිෂ්පාදන.

- යතුරු ලියනය.
- අත්යන්ත්‍ර **පේෂ**කර්මාන්තය.
- කරත්තය, තිරික්කලය.
- ගල්ලෑලි ,ගල්කූරු.
- roniyo මුද්‍රණ යන්ත්‍රය.

## ආර්ථික පරිසරය.

ආර්ථික පරිසරය යනු ව්‍යාපාර කෙරෙහි බලපාන **ආර්ථික** සාධක ඇතුළත් පරිසරයයි.

## ව්‍යාපාර වලට බලපෑම් ඇතිවිය හැකි ආර්ථික පරිසර සාධක.

- උද්ධමනය.
- පොලී අනුපාතය.
- ආදායම් ව්‍යාප්තිය.
- රැකියා නියුක්තිය.
- ජාත්‍යන්තර සබඳතා.
- විදේශ විනිමය අනුපාතය.
- ඉතුරුම්.
- වැටුප් මට්ටම.
- බදු ප්‍රතිපත්ති.
- ආයෝජන.

# ආර්ථික පරිසර සාධක වලට අයත් විචල්‍යයන් නිසා ව්‍යාපාර වලට වන බලපෑම.

| පරිසර සාධකයේ විචලනය | ව්‍යාපාරයට බලපාන ආකාරය |
|---|---|
| පොළී අනුපාතය | පොළී අනුපාත අඩුවීමෙන් ණය ඉල්ලුම ඉහළ ගොස් ආයෝජනය වැඩිවීම නිසා නිෂ්පාදනය පුළුල් වේ. |
| භාණ්ඩ හා සේවාවල මිල මට්ටම් ඉහළ යාම (උද්ධමනය) | එවිට ව්‍යාපාරවල වියදම් වැඩිවේ. එවිට වියදම් පාලනය කිරීමට කටයුතු කරයි. |
| ඉතුරුම් | රටක ඉතුරුම් වර්ධනය වන විට ආයෝනය සඳහා යෙදවිය හැකි මුදල් ප්‍රමාණය ඉහළ යයි. එය ව්‍යාපාරවල දියුණුවට හේතු වේ. |
| බදු අයකිරීම | භාණ්ඩ හා සේවා සඳහා පැනවූ බදු ප්‍රතිශතය වැඩිකළහොත් ව්‍යාපාරවල සකස් කළ මූල්‍ය ප්‍රකාශවල බදු පසු ලාභය අඩුවීමක් සිදුවේ. |
| ජාතික ආදායම | ජාතික ආදායම වැඩිවන විට ඒකපුද්ගල ආදායම වැඩිවේ. එවිට පුද්ගලයින්ගේ මිලදීගැනීමේ ශක්තිය වැඩිවීමෙන් භාණ්ඩවලට ඇති ඉල්ලුම ඉහළ යයි. |
| ජාත්‍යන්තර සබඳතා | රටක් තවත් රටවල් සමග ඇතිකරගන්නා ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීම ව්‍යාපාරවලට නව වෙළඳපොලවල් සොයාගැනීමට හේතු වේ. එවිට අලෙවිය වැඩිවී ව්‍යාපාර දියුණුවට හේතු වේ. |

## උද්ධමනය යනු කුමක්ද?

- භාණ්ඩ හා සේවා අලෙවියේ දී තීරණය වන පොදු මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම උද්ධමනයයි.

### භාණ්ඩ මිල වැඩිවීමට බලපෑ ඇති සාධක.

- භාණ්ඩ හා සේවා මත අයකරන බදු ප්‍රතිශතය වැඩි කිරීම.
- නිෂ්පාදන සාධක වල මිල ගණන් ඉහළ යාම.
- භාණ්ඩ සැපයීම අඩුවීම.
- ඉල්ලුම වැඩිවීම.

## විනිමය අනුපාතය යනු කුමක්ද?

යම් රටක මුදල් ඒකකයක් තවත් රටක මුදල් ඒකක සමඟ හුවමාරු වන අනුපාතයයි.

ශ්‍රී ලංකා රුපියල පහත දැක්වෙන විදේශ මුදල් වර්ග සමග හුවමාරු වන අනුපාත දක්වන්න.

| විදේශ මුදල් වර්ගය | හුවමාරු අනුපාතය |
|---|---|
| ඇමෙරිකානු ඩොලරය | 193.00 |
| බ්‍රිතාන්‍ය පවුම | 263.74 |
| ජපාන යෙන් | 1.84 |
| ඉන්දියානු රුපියල් | 2.65 |
| යුරෝ | 232.20 |

# ගෝලීය පරිසරය

## ගෝලීය පරිසරය යනු කුමක්ද?

ලෝකයේ විවිධ රටවල් අතර පැවති සීමාවන් හා බාධක ඉවත් වී මුළු ලෝකයම එකම ගම්මානයක් ලෙස කටයුතු කිරීම ගෝලීය පරිසරය ලෙස සරලව හැඳින්විය හැකිය. එබැවින් ලෝකය විශ්ව ගම්මානයක් ලෙස සැලකේ.

## දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑම්.

- නව තාක්ෂණය ලබා ගත හැකි වීම.
- ගුණාත්මක විදේශීය අමුද්‍රව්‍ය ලබාගත හැකිවීම.
- කාර්යක්ෂම යන්ත්‍ර සූත්‍ර ලබා ගත හැකි වීම.
- විදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම.
- දේශීය භාණ්ඩ හා සේවා සඳහා විදේශීය ලබාගත හැකි වීම.

## දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑම්.

- දැඩි තරගකාරිත්වයට මුහුණ දීමට සිදුවීම.
- දේශීය පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදීයාම.
- දේශීය ව්‍යාපාර වල පැවැත්ම අස්ථාවර වීම.
- දේශීය සංස්කෘතියේ අයහපත් වෙනස්කම් ඇතිවීම.

## ශදුඅත විශ්ලේෂණය (SWOT Analysis) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

- ශදුඅත විශ්ලේෂණය යනු ව්‍යාපාර පරිසරයේ පවතින විවිධ ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන හඳුනාගැනීම සඳහා සිදුකරනු ලබන ඇගයීමකි. විශේෂයෙන් අභ්‍යන්තර පරිසරයේ ශක්තීන් හා දුර්වලතාත් බාහිර පරිසරයේ ඇති අවස්ථා සහ තර්ජනයන්ද හඳුනාගැනීම මේ මගින් සිදුකළ හැකිය.

## ශදුඅත විශ්ලේෂණයේ අවශ්‍යතාවය කුමක්ද?

- ව්‍යාපාරය සතු ශක්තීන් හඳුනාගැනීමට හැකිවීමෙන් උපරිම ප්‍රයෝජන ලබාගැනීමට අවස්ථාව උදාවීම.
- ව්‍යාපාරය සතු දුර්වලතා හඳුනාගැනීම නිසා එම දුර්වලතා ඉවත්කර ගැනීමට සහ නිවැරදි කර ගැනීමට අවස්ථාව උදාවීම.
- බාහිර පරිසරයේ ඇති අවස්ථා හඳුනාගෙන එය ව්‍යාපාරයේ වර්ධනයට යොදාගත හැකි වීම.
- බාහිර පරිසරයේ ඇති තර්ජනයන් හඳුනාගෙන ඒවාට සාර්ථකව මුහුණදීමේ හැකියාවලබාගැනීම.

ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක ව්‍යාපාරයට ඇති ශක්තීන් හා දුර්වලතා සැසඳීමට පදනම් කර ගනී.

## ශක්තීන්

ව්‍යාපාර කටයුත්තක් ආරම්භ කිරීමට හෝ පවත්නා ව්‍යාපාර කටයුත්තක් හොඳින් පවත්වාගෙන යාමට තමුන්ට ඇති හැකියාව ශක්තීන් ලෙස හඳුන්වයි.

### ව්‍යාපාරයකට ඇති ශක්තීන්

- ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තිබීම.
- කළමනාකරුවන්ගේ අත්දැකීම්.
- සේවකයන්ගේ විශේෂිත දැනුම හා කැපවීම.
- සුවිශේෂී නිෂ්පාදන ක්‍රම.
- පිළිගත් සන්නම් නාමයක් තිබීම.
- නායකත්වය.
- හොඳ සැලැස්මක් හා දැක්මක් තිබීම.

# දුර්වලතා

ව්‍යාපාර කටයුත්තක් ආරම්භ කිරීමට හෝ පවත්නා ව්‍යාපාර කටයුත්තක් හොඳින් පවත්වාගෙන යාමට තමන්ට ඇති නොහැකියාව දුවර්ලතා ලෙස හඳුන්වයි.

## ව්‍යාපාරයකට පවතින දුර්වලතා

- අයිතිකරුවන්ගේ මූල්‍ය ශක්තිය ප්‍රමාණවත් නොවීම .
- පුහුණු සේවකයන්ගේ හිඟය.
- තාක්ෂණික දැනුම යාවත්කාලීන නොවීම.
- සේවකයන්ගේ අයහපත් ආකල්ප.
- ව්‍යාපාරයේ භූගෝලීය පිහිටීම නුසුදුසු වීම.
- හොඳ නායකත්වයක් නොතිබීම.
- තීරණ ගැනීමේ දුර්වලතා.
- හොඳ සැලැස්මක් හා දැක්මක් නොතිබීම.

ව්‍යාපාරයකට බාහිර පරිසර සාධක විශ්ලේෂණයෙන් ව්‍යාපාර කෙරෙහි හිතකර සාධක එනම් ව්‍යාපාර අවස්ථා උදාකරන සාධක මෙන්ම ව්‍යාපාරවලට අභියෝගාත්මක වන සාධකද හඳුනාගත හැකිය

## අවස්ථා

ව්‍යාපාර පරිසරයේ සිදුවන වෙනස්වීම් හඳුනාගෙන මිනිස් වුවමනා සම්පූර්ණ කිරීම සඳහා ව්‍යාපාර අදහස් බිහිවන අතර, ඒවා ව්‍යාපාරික අවස්ථාවන් ලෙස හැඳින්වේ. මෙහිදී ව්‍යාපාර අදහසක් යනු නව නිර්මාණයක් හෝ පවතින තත්වයක ස්වභාවය වෙනස් කිරීමක් විය හැකිය.

## ව්‍යාපාර අවස්ථා බිහිකරන සාධක

- පාරිභෝගිකයන්ගේ ජීවන රටාව වෙනස් වීම.
- රජය විසින් අඩු පොලී ණය ක්‍රම හඳුන්වා දීම.
- ව්‍යාපාර සඳහා බදු සහන ලබා දීම.
- නව නගර නිර්මාණය.
- අධිවේගී මාර්ග ඉදිකිරීම.

## තර්ජන (අභියෝග)

ව්‍යාපාර ආරම්භ කිරීමේදී සහ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේදී මුහුණපෑමට සිදුවන විවිධ බාධාකාරී සාධක තර්ජන ලෙස හැඳින්වේ.

# ව්‍යාපාරවලට අභියෝගාත්මක සාධක (තර්ජන)

- ජාත්‍යන්තර වෙළඳ සම්බාධක පැනවීම.
- තරගකරුවන් බිහිවීම.
- ස්වභාවික ආපදා.
- නව තාක්ෂණ ක්‍රම සඳහා අනුගත වීම දුෂ්කර වීම.







# අභ්‍යාස

01. ව්‍යාපාර පරිසරය හඳුන්වන්න.

02. ව්‍යාපාර පරිසරය වර්ගකර දක්වන්න.

03. අභ්‍යන්තර පරිසර අධ්‍යයනයෙන් හඳුනාගත හැකි ශක්තීන් හා දුර්වලතා නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

04. බාහිර පරිසර අධ්‍යයනයෙන් හඳුනාගත හැකි අවස්ථා හා තර්ජන පොදු නිදසුන් මගින් හඳුන්වන්න.

05. ලැයිස්තු දෙකක් පිළියෙල කරන්න. ඉන් එක ලැයිස්තුවක ශ්‍රී ලංකා රජය ජනතාවට ලබාදෙන ශුභසාධනද, අනෙක් ලැයිස්තුවේ ව්‍යාපාරවලට ලබාදෙන දිරිගැන්වීම්ද සඳහන් කරන්න.

06. ගෝලීයකරණය යනු කුමක්ද?

07. පහත සඳහන් දෑ ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.

- විද්‍යුත් තැපැල (e-mail)
- ජංගම දුරකථන (Mobile Phone)
- අන්තර්ජාලය (Internet)
- බ්‍රෝඩ්බෑන්ඩ් (Broadband)
- Facebook
- Twitter
- Skype

08. විද්‍යුත් වාණිජ්‍ය (e-commerce) යනු කුමක්ද?

09. ව්‍යාපාරවලට බලපෑම් කරන අණපනත් 3ක් නම්කරන්න.

10. ව්‍යාපාරවලට බලපෑම් ඇතිකරන නීතිරීති ක්‍රියාත්මක කිරීම සඳහා පනවා ඇති තනතුරු නම්කරන්න.

11. ව්‍යාපාරවලට බලපෑම් කිරීම සඳහා පිහිටුවා ඇති ආයතන 2ක් ලියන්න.

12. සාර්ථක ව්‍යාපාරිකයන් විසින් ව්‍යාපාරික පරිසරය අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගනු ලබන්නේ මොනවාද?

13. ඔබ ප්‍රදේශයේ තිබෙන ව්‍යාපාරයක් සැලකිල්ලට ගෙන එහි ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ විමසීමක් කර වගුගත කරන්න.

.............................................................................. ව්‍යාපාරය

| ශක්තීන් | දුර්වලතා | අවස්ථා | තර්ජන |
|---|---|---|---|
| | | | |

14. ව්‍යාපාර සඳහා බලපාන දේශීය හා ගෝලීය වෙනස්කම් පහක් බැගින් සඳහන් කරන්න.

15. පහත සඳහන් ආර්ථික පරිසර සාධක කෙටියෙන් පහදන්න.

- ★ පොලී අනුපාතය.
- ★ උද්ධමනය.
- ★ විදේශ විනිමය අනුපාතය.
- ★ රැකියා නියුක්තිය.

16. ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය සම්බන්ධයෙන් පවතින අවස්ථා 5ක් සහ තර්ජන 5ක් සඳහන් කරන්න.